# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1990/29 - 2016 ඔක්තෝබර් මස 27 වැනි බ්‍රහස්පතින්ද - 2016.10.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

**මුදල් මණ්ඩලය**

**ශ්‍රී ලංකා මහ බැංකුව**

2016 ඔක්තෝබර් 27 **ක්ෂුද්‍රමූල්‍ය පනතේ රීති** 2016 අංක 01

**බලපත්‍රය සඳහා වන නිර්ණායක**

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 13(2) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

| | | |
|---|---|---|
| 1. යෝග්‍යතාවය | 1.1. | පනත යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලැබීමට නම්, අයදුම්කරු 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමක් විය යුතු අතර, එම සමාගම ඇපයෙන් සීමිත සමාගමක්, පෞද්ගලික සමාගමක්, අක්වෙරළ සමාගමක් හෝ විදේශීය සමාගමක් නොවිය යුතු ය. |
| | 1.2. | පසුගිය අවුරුදු තුනට අදාළව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ක්ෂුද්‍රමූල්‍ය කටයුතු හා සම්බන්ධ ක්‍රියාකාරකම් ඇතුළත් වාර්තාවක් සෑම අයදුම්කරන සමාගමක් විසින්ම ඉදිරිපත් කළ යුතු ය. |
| 2. අවම මූලික ප්‍රාග්ධනය | 2.1. | සෑම අයදුම් කරන සමාගමක්ම 2016 අංක 01 දරන මූලික ප්‍රාග්ධන විධානයන්හි දක්වා ඇති පරිදි රුපියල් මිලියන 100 ක (රු.100,000,000/-) අවම මූලික ප්‍රාග්ධනයක් හෝ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ඊට වඩා වැඩි වටිනාකමකින් යුත් අවම මූලික ප්‍රාග්ධනයක් පවත්වා ගත යුතු ය. |
| 3. මණ්ඩලයේ සංයුතිය | 3.1. | මණ්ඩලයේ අධ්‍යක්ෂවරු සංඛ්‍යාව තිදෙනෙකුට (03) වඩා නොඅඩු විය යුතු අතර නවදෙනෙකුට (09) වඩා වැඩි නොවිය යුතු ය. |
| | 3.2. | මණ්ඩලය, විධායක අධ්‍යක්ෂවරු, ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු සහ ස්වාධීන නොවන හා විධායක නොවන අධ්‍යක්ෂවරු, යන අයගෙන් සමන්විත විය හැකිය. |
| | 3.3. | විධායක අධ්‍යක්ෂවරු සංඛ්‍යාව අධ්‍යක්ෂ මණ්ඩලයෙන් තුනෙන් එකකට වඩා නොවැඩි විය යුතු ය. (විධායක අධ්‍යක්ෂවරයා යනුවෙන් අදහස් කෙරෙන්නේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්කළ, තෝරාගත් හෝ නම් කරන ලද සමාගමේ සේවා නියුක්තිකයෙකු වේ). |

1A - G 24455 — 27 (2016/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3.4. අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුගෙන් හෝ මුළු අධ්‍යක්ෂ මණ්ඩලයෙන් තුනෙන් එකක් යන අගයන් දෙකෙන් ඉහළ අගයක් ගන්නා සංඛ්‍යාවකින් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතු ය.

විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන වශයෙන් නොසලකන්නේ, ඔහු හෝ ඇය,

(අ) සතුව සමාගමේ කොටස් සියයට පහකට වඩා සෘජු සහ/හෝ වක්‍ර ලෙස පවතින්නේ නම් ;
(ආ) අධ්‍යක්ෂවරයෙක් වශයෙන් පත්වීමට පෙර ළඟම වර්ෂ දෙක (02) තුළ සමාගමේ සේවකයෙකු ලෙස කටයුතු කර ඇත්නම් ;
(ඇ) සමාගමේ යම් අධ්‍යක්ෂවරයෙකුට, ප්‍රධාන විධායක නිලධාරියාට හෝ සමාගමේ විශේෂිත කොටස් හිමියෙකුට සමීප ඥාතීත්වයක් ඇත්නම් ;

මේ සඳහා සමීප ඥාතීත්වය යනුවෙන් අදහස් වන්නේ, කලත්‍රයා හෝ යැපෙන දරුවෙකු වේ.

(ඈ) සමාගමේ යම් විශේෂිත කොටස් හිමියකු නියෝජනය කරන්නේ නම්.

4. අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම

4.1. ඇමුණුම 1 හි දැක්වෙන "DSMI/LMFC/A" පෝරමයේ ආකාරයට බලපත්‍රය සඳහා වන සියලුම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

5. ඇගයීම් ගාස්තුව

5.1. සෑම අයදුම්කරන සමාගමක්ම අයදුම්පත්‍රය ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කිරීමේ දී රුපියල් පනස්දහසක (රු, 50,000) නැවත නොගෙවන ඇගයීම් ගාස්තුවක් ගෙවිය යුතු ය.

6. අර්ථනිරූපනය

6.1. යැපෙන දරුවෙකු යන්නට 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ සඳහන් වන අර්ථ නිරූපනය ගෙන දේ.

ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
මුදල් මණ්ඩලයේ සභාපති
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

ඇමුණුම 1
පෝරමය DSMI/LMFC/A

රහසිගතයි

**2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ බලපත්‍රයක් සඳහා අයදුම්පත්‍රය**

උපදෙස්

(1) සියලුම අයදුම්පත් යතුරුලියනය කර හෝ ඉතා පැහැදිළි අකුරින් ලියා තිබිය යුතු ය.
(2) අයදුම්පත්‍රයේ අදාළ තොරතුරු පිළිබඳ සම්පූර්ණ විස්තර සැපයීමට ලබාදී ඇති ඉඩ ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය අවස්ථාවලදී අමතර කඩදාසි පාවිච්චි කරන්න. එවැනි සෑම අමතර කඩදාසියකම අදාළ අයදුම්පතේ හරස් යොමුව දැක්විය යුතු ය. යම් තොරතුරක් අදාළ නොවන්නේ නම් ඒ බව පැහැදිළිව සඳහන් කළ යුතු ය.
(3) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඇමුණුම් ද ඇතුළත්ව සෑම පිටුවක්ම අඩුම වශයෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් කෙටිසන් තැබිය යුතු ය.
(4) 1 වන උපලේඛනයේ සඳහන් කර ඇති සියලුම ලේඛන අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.
(5) අයදුම්කරන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයින්ගේ අත්සන් සහිත සම්පූර්ණ කරන ලද අයදුම්පත, අනිකුත් ලේඛනද සමග පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ යුතු ය.

අධ්‍යක්ෂ
ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත
කොළඹ 01

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත
ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ 01.

........................................................................................ පිහිටි
(ලිපිනය)

........................................................................................
(නම)

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ විධිවිධානයන්ට අනුකූලව බලපත්‍රයක් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත මෙයින් අයදුම් කරනු ලැබේ. අයදුම්පත සනාථ කිරීම සඳහා පහත තොරතුරු හා ලේඛන ඉදිරිපත් කරනු ලැබේ.

(1) සමාගමේ සාමාන්‍ය තොරතුරු -

1.1. සමාගමක් වශයෙන් සංස්ථාපිත කළ දිනය ඃ

1.2. ව්‍යාපාර කටයුතු ආරම්භ කළ දිනය ඃ

1.3. පහත සඳහන් ස්ථානයන්හි ලිපිනයන් ඃ

1.3.1. ලියාපදිංචි කළ කාර්යාලය ඃ
1.3.2. ප්‍රධාන / පරිපාලන කාර්යාලය ඃ
1.3.3. ශාඛා කාර්යාලය(න්) ඃ

| පිහිටීම | දිස්ත්‍රික්කය | පළාත | සම්බන්ධ කරගත හැකි තොරතුරු |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

1.4. සමාගමේ මූල්‍ය වර්ෂය ඃ

1.5. ප්‍රධාන ව්‍යාපාර කටයුතු පිළිබඳ විස්තර ඃ
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

1.6. අයදුම්කරන දිනට සමාගමේ කොටස් හිමි ව්‍යුහය ඃ

1.6.1. මුළු කොටස් ගණන ඃ
1.6.2. කොටස් හිමිකරුවන්ගේ සංඛ්‍යාව ඃ
1.6.3. ප්‍රධාන කොටස් හිමිකරුවන් 10 දෙනාගේ නම්[අ1]

| කොටස් හිමිකරුවාගේ නම | කොටස් සංඛ්‍යාව | නිකුතු කොටස් ප්‍රාග්ධනයට ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |
| 9. | | |
| 10. | | |

[අ1] 1 වන උපලේඛනයෙහි 4 වන අයිතමය උපයෝගී කරගන්න.

1.7. (අ) අධ්‍යක්ෂ මණ්ඩලය

| අධ්‍යක්ෂවරයාගේ සම්පූර්ණ නම (කරුණාකර පළමුව සභාපතිගේ නම සඳහන් කරන්න) | පදිංචි ලිපිනය | උපන් දිනය දින/මාස/ අවු. | ජා.හැ.ප. අංකය | විදේශ ගමන් බලපත්‍ර අංකය | අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කළ දිනය දින/මාස/අවු. | සුදුසුකම් | රැකියාව අ/ | සම්බන්ධ කරගත හැකි තොරතුරු |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | | | | | | | | |
| 2. | | | | | | | | |
| 3. | | | | | | | | |
| 4. | | | | | | | | |
| 5. | | | | | | | | |
| 6. | | | | | | | | |
| 7. | | | | | | | | |
| 8. | | | | | | | | |
| 9. | | | | | | | | |

අ/ අනෙකුත් ආයතනයන්හි දරන තනතුරු

1.7. (ආ) ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි

| ප්‍රධාන විධායක නිලධාරියාගේ/ සාමාන්‍යාධිකාරිගේ සම්පූර්ණ නම | පදිංචි ලිපිනය | උපන් දිනය දින/මාස/ අවු. | ජා.හැ.ප. අංකය | විදේශ ගමන් බලපත්‍ර අංකය | ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරී ලෙස පත්කළ දිනය දින/මාස/අවු. | සුදුසුකම් | රැකියාව අ/ | සම්බන්ධ කරගත හැකි තොරතුරු |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | | | | | | | | |
| 2. | | | | | | | | |

අ/ අනෙකුත් ආයතනයන්හි දරන තනතුරු

1.8. සමාගමේ ලේකම්ගේ නම, ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි තොරතුරු :

1.9. සමාගමේ බැංකුකරුවන්ගේ නම් සහ ලිපිනයන් :

| බැංකුවේ නම | ශාඛාව | ලිපිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |

1.10. **විගණකවරු (බාහිර)**

1.10.1. බාහිර විගණකගේ නම, ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි තොරතුරු :

1.10.2. කුමන මූල්‍ය වර්ෂයේ සිට සමාගමේ විගණන කටයුතු ඉහත කී විගණක විසින් සිදුකරනු ලබන්නේ ද?

1.10.3. විගණන ආයතනයේ හවුල්කරුවන්/අධ්‍යක්ෂවරුන් සමාගමේ කොටස් හිමියන් වේද? (ඔව් නම් කරුණාකර විස්තර සපයන්න).

1.10.4. පසුගිය මූල්‍ය වර්ෂ තුන සඳහා ගෙවන ලද විගණන ගාස්තු :

1.10.5. විගණන ආයතනයට හෝ විගණන ආයතනයේ හවුල්කරුවකුට/අධ්‍යක්ෂවරයෙකුට කුමන හෝ ආකාරයේ මූල්‍ය පහසුකමක් ලබාදී ඇත්ද? (ඔව් නම් කරුණාකර විස්තර සපයන්න).

1.11. **විගණකවරු (අභ්‍යන්තර)**

1.11.1. සමාගම සතුව අභ්‍යන්තර විගණකවරයෙකු හෝ අභ්‍යන්තර විගණන අංශයක් පවතී ද යන්න සඳහන් කරන්න. එසේ පවතී නම්, පහත විස්තර සපයන්න.

(අ) අභ්‍යන්තර විගණකගේ නම :

(ආ) සුදුසුකම් සහ පළපුරුද්ද :

(ඇ) අභ්‍යන්තර විගණන කටයුතු කරන සම්පූර්ණ කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ සුදුසුකම් :

| නම | සුදුසුකම් | සේවයේ යෙදී සිටින වර්ෂ ගණන |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |

1.11.2. අභ්‍යන්තර විගණන කටයුතු බාහිර ආයතනයක් හරහා සිදුකරනු ලබන්නේ නම් ;

පහත තොරතුරු සඳහන් කරන්න.

(අ) අභ්‍යන්තර විගණක සමාගමේ නම :
(ආ) ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි තොරතුරු :
(ඇ) සුදුසුකම් හා පළපුරුද්ද :
(ඈ) සමාගමේ විගණන කටයුතු සිදු කළ ඇති වසර ගණන :

1.11.3. අභ්‍යන්තර විගණක වාර්තා කළ යුතු අධිකාරය :

2. **සමාගමේ මූලික ප්‍රාග්ධනය අ'**

පසුගිය මූල්‍ය වර්ෂ තුනට (3) අදාළව සහ අයදුම්පත්‍රය සකස් කරන මාසයට පෙර මාසයේ අවසාන දිනට අදාළව ;

(රු. '000)

| අයිතමය | 20..... | 20..... | 20..... | ................ දිනට |
|---|---|---|---|---|
| (අ) නිකුතු සහ සම්පූර්ණයෙන් ගෙවා නිමි කොටස් (මුදලට) | | | | |
| (ආ) නිකුතු සහ සම්පූර්ණයෙන් ගෙවා නිමි සමුච්චිත නොවන නිදහස් කළ නොහැකි කොටස් (මුදලට) | | | | |
| (ඇ) ව්‍යවස්ථාපිත සංචිත | | | | |
| (ඈ) පොදු සංචිත | | | | |
| (ඉ) පසුගිය විගණන වාර්තාවට අනුව රඳවාගත් ලාභය හෝ (අලාභය) | | | | |
| (ඊ) පවතින වසරේ ප්‍රකාශයට පත් නොකළ ලාභය හෝ (අලාභය) | | | | |
| (උ) මූලික ප්‍රාග්ධනය (අ) සිට (ඊ) දක්වා | | | | |

අ' 1 වන උපලේඛනයේ අයිතම අංක 6 උපයෝගී කරගන්න.

3. **නිශ්චල දේපළවල විස්තර (ඉඩම් හා ගොඩනැගිලි)**[අ/]

| නිශ්චල දේපළ වර්ගය | පිහිටීම | පිරිවැය | ප්‍රත්‍යාගණනය (ඇත්නම්) | |
|---|---|---|---|---|
| | | | දිනය | වටිනාකම (රු.) |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

[අ/]1 වන උපලේඛනයේ අයිතම අංක 7 උපයෝගී කරගන්න.

4. **සම්බන්ධිත පාර්ශව නිරාවරණය (රු'000)**

| සමාගමේ /තනි පුද්ගලයන්ගේ නම | සම්බන්ධතාවයේ ස්වභවය[1] | ව්‍යාපාරයේ ස්වභාවය | කොටස්හි ආයෝජන[2] | | ණය සහ අත්තිකාරම්[3] | | සුරැකුම්[4] | | වෙනත් නිරාවරණ[5] | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වටිනාකම | කොටස් හිමිකාරත්ව ප්‍රතිශතය (%) | ශේෂ පත්‍රය මත | ශේෂ පත්‍රයෙන් පිටත | වටිනාකම | වර්ගය[6] | ශේෂ පත්‍රය මත | ශේෂ පත්‍රයෙන් පිටත | ගනුදෙනුවල ස්වභාවය සඳහන් කරන්න |
| සමාගම් | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| තනි පුද්ගල | | | | | | | | | | | |

[1]H - පාලක සමාගම S - පාලිත (සෘජු හෝ වක්‍ර අයිතිය) A - ආශ්‍රිත (සෘජු හෝ වක්‍ර අයිතිය) OI - වෙනත් ආයෝජිත ආයතන D - සමාගමේ අධ්‍යක්ෂවරු DH - පාලක සමාගමේ අධ්‍යක්ෂවරු DS - පාලිත සමාගමේ අධ්‍යක්ෂවරු DA - ආශ්‍රිත සමාගමේ අධ්‍යක්ෂවරු DOI - වෙනත් ආයෝජිත ආයතනයන්හි අධ්‍යක්ෂවරු SDC - සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ කලත්‍රයා සහ යැපෙන දරුවන් SDCO - සම්බන්ධිත සමාගම් හි අධ්‍යක්ෂවරුන්ගේ කලත්‍රයා සහ යැපෙන දරුවන් KMP - ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් KMPO - සමාගමේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ කලත්‍රයා සහ යැපෙන දරුවන් JD - වෙනත් ආයතනයන්හි අධ්‍යක්ෂවරු වන සමාගමේ අධ්‍යක්ෂවරු (පොදු අධ්‍යක්ෂ පදනම් කරගෙන)

[2] කොටස් හිමිකාරීත්වය නිකුතු මුලු කොටස් ප්‍රාග්ධනයට ප්‍රතිශතයක් ලෙස

[3] අයදුම්කරන සමාගම විසින් සම්බන්ධිත සමාගම්/පුද්ගලයින් වෙත සපයා ඇති ණය සහ අත්තිකාරම්

[4] අයදුම්කරන සමාගම විසින් සම්බන්ධිත සමාගම්/ පුද්ගලයින් වෙත සපයා ඇති ණය සහ අත්තිකාරම් සඳහා ලබා ගෙන ඇති සුරැකුම්

[5] ණය සහ අත්තිකාරම් සහ කොටස් ආයෝජන හැර අනෙකුත් නිරාවරණ උදා.- අන්තර් සමාගම් ගනුදෙනු

[6] IPF - නිශ්චල දේපළ (නිර්බාධ පදනම) IPL - නිශ්චල දේපළ (කල්බදු පදනම) C - මුදල් GS - රජයේ සුරැකුම්පත් S - සමාගමේ කොටස් SO - සම්බන්ධිත සමාගම් වල කොටස් O - අනෙකුත් සුරැකුම්

*සටහන: - සමාගමේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් යන්නෙන් ඍජුව හෝ වක්‍රව ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ කටයුතු සැලසුම් කිරීම , ඒ සඳහා විධාන කිරීම හා පාලනය කිරීම සඳහා බලය සහ වගකීම දරනු ලබන යම් තැනැත්තෙකු අදහස් වේ.*

5. **විශාල නිරාවරණ**

(ඉල්ලුම්කරන සමාගමේ මූලික ප්‍රාග්ධනයෙන් සියයට පහක් (5%) ඉක්මවන හෝ විශාලතම නිරාවරණ දහය)

| සමාගමේ/තනි පුද්ගලයන්ගේ නම | සම්බන්ධතාවයේ ස්වභාවය[1] | ණය වර්ගය[7] | වර්ගීකරණය[8] | ණය සහ අත්තිකාරම් | | සුරැකුම් | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රධානය කළ වටිනාකම (රු. '000) | පිටහිටි ශේෂය (රු. '000) | වටිනාකම (රු. '000) | වර්ගය |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

[1]H - පාලක සමාගම
S - පාලිත (ඍජු හෝ වක්‍ර පාලිත අයිතිය)
A - ආශ්‍රිත (ඍජු හෝ වක්‍ර ආශ්‍රිත අයිතිය)
OI - වෙනත් ආයෝජන ඒකක
D - සමාගමේ අධ්‍යක්ෂවරු
DH - පාලක සමාගමේ අධ්‍යක්ෂවරු
DS - පාලිත සමාගමේ අධ්‍යක්ෂවරු
DA - ආශ්‍රිත සමාගමේ අධ්‍යක්ෂවරු
DOI - වෙනත් ආයෝජන ඒකකයන්හි අධ්‍යක්ෂවරු
SDC - සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ කලත්‍රයා සහ යැපෙන දරුවන්
SDCO - සම්බන්ධිත සමාගම් හි අධ්‍යක්ෂවරුන්ගේ කලත්‍රයා සහ යැපෙන දරුවන්
KMP - ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධාරීන්
KMPO - සමාගමේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ කලත්‍රයා සහ යැපෙන දරුවන්
JD - වෙනත් ඒකකයන්හි අධ්‍යක්ෂවරු වන සමාගමේ අධ්‍යක්ෂවරු (පොදු අධ්‍යක්ෂ පදනම් කරගෙන)

[7]TL -කාලීන ණය L - කුලී පිට ගැනුම් HP - කල් බදු P - උකස් O - වෙනත්

[8]C - හිඟ නොමැති 0- දින 61 -90 දක්වා හිඟ S - දින 91 -180 දක්වා හිඟ D - දින 181 -360 දක්වා හිඟ

L - දින 360 ට වඩා හිඟ

6. වත්කම්වල ගුණාත්මකභාවය

| ණය වර්ගය | ක්‍රමික ණය | | අක්‍රමික ණය | | | | | | | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | හිඟ නොමැති | | දින 61 - 90 දක්වා හිඟ | | දින 91 - 180 දක්වා හිඟ | | දින 181 - 360 දක්වා හිඟ | | දින 360ට වඩා හිඟ | | | |
| | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු. '000) | ගිණුම් සංඛ්‍යාව | පිටහිට ශේෂය (රු. '000) | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු. '000) | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු. '000) | ගිණුම සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු. '000) | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු. '000) |
| කාලීන ණය | | | | | | | | | | | | |
| කල්බදු | | | | | | | | | | | | |
| කුලී පිට ගැණුම් | | | | | | | | | | | | |
| උකස් ණය | | | | | | | | | | | | |
| වෙනත් | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | | |

7. අයදුම්පත්‍රය ඉදිරිපත් කරන මාසයට පෙර මාසයේ අවසානයට අදාළව සමාගම විසින් ලබාගත් ණය පිළිබඳ විස්තර

| මූලාශ්‍ර | ලබාගත් මුදල (රු. '000) | වාර්ෂික පොළී අනුපාතිකය | ණය ලබාගත් දිනය | සුරැකුමේ ස්වභාවය | පිටහිටි ශේෂය (රු. '000) |
|---|---|---|---|---|---|
| (අ) බලපත්‍රලාභී බැංකුවලින් | | | | | |
| i. | | | | | |
| ii. | | | | | |
| (ආ) වෙනත් මූල්‍ය ආයතන මගින් | | | | | |
| i. | | | | | |
| ii. | | | | | |
| (ඇ) අධ්‍යක්ෂවරුන්ගෙන් | | | | | |
| i. | | | | | |
| ii. | | | | | |
| (ඈ) වෙනත් මූලාශ්‍ර මගින් | | | | | |
| i. | | | | | |
| ii. | | | | | |
| එකතුව | | | | | |

8. අයදුම්පත්‍රයේ සඳහන් දිනට පැවතුනු පොළී අනුපාතික/අයකිරීම්

| වර්ගය | ණය පොලී අනුපාතික (පරාසය/වාර්ෂික) | | | | පැහැරහැරීමේ ගාස්තු | |
|---|---|---|---|---|---|---|
| | මාස 12ට අඩු | මාස 12 | මාස 24 | මාස 24ට වැඩි | % | මුදල (රු. '000) |
| ණය | | | | | | |
| කුලීපිට ගැනුම් | | | | | | |
| මූල්‍ය කල්බදු | | | | | | |
| උකස් | | | | | | |
| වෙනත් | | | | | | |

මෙම අයදුම්පතේ සඳහන් තොරතුරු පරීක්ෂා කළ බවත්, ඒවා සෑම අතින්ම සම්පූර්ණ බවත් සහ අපගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට එම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, අපි ප්‍රකාශ කර සිටිමු.

.................................................................................................................................................................වෙනුවෙන්
(අයදුම්කරන සමාගමේ නම)

| අධ්‍යක්ෂවරුන්ගේ නම් | අත්සන |
|---|---|
| 1 ............................................................ | .................................................... |
| 2 ............................................................ | .................................................... |
| 3 ............................................................ | .................................................... |
| 4 ............................................................ | .................................................... |
| 5 ............................................................ | .................................................... |
| 6 ............................................................ | .................................................... |
| 7 ............................................................ | .................................................... |
| 8 ............................................................ | .................................................... |
| 9 ............................................................ | .................................................... |

දිනය :- ...................................... (සමාගමේ පොදු මුද්‍රාව)

9. සමාගම වෙනත් සමාගමක පාලිත හෝ ආශ්‍රිත හෝ සමාගම් සමූහයක සාමාජිකයෙකු වේ නම්, පාලක සමාගමේ පහත විස්තර සපයන්න.

**9.1. පාලක සමාගමේ සාමාන්‍යය තොරතුරු**

9.1.1. සමාගමක් වශයෙන් සංස්ථාපිත කළ දිනය :
9.1.2. ව්‍යාපාර කටයුතු ආරම්භ කළ දිනය :
9.1.3. පහත සඳහන් ස්ථානයන්හි ලිපිනයන්:

9.1.3.1. ලියාපදිංචි කළ කාර්යාලය :
9.1.3.2. ප්‍රධාන / පරිපාලන කාර්යාලය :
9.1.3.3. ශාඛා කාර්යාලය(න්) :

**9.2. ප්‍රධාන ව්‍යාපාර කටයුතු පිළිබඳ විස්තර:**

........................................................................................................................................................
........................................................................................................................................................

9.3. පාලක සමාගමේ කොටස් හිමි ව්‍යුහය

9.3.1. ප්‍රධාන කොටස් හිමිකරුවන් 10 දෙනාගේ නම්

| කොටස් හිමිකරුවාගේ නම | කොටස් සංඛ්‍යාව | නිකුතු කොටස් ප්‍රාග්ධනයට ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4 | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |
| 9. | | |
| 10. | | |

9.4.1. (අ) අධ්‍යක්ෂ මණ්ඩලය

| අධ්‍යක්ෂවරයාගේ සම්පූර්ණ නම (කරුණාකර සභාපතිගේ නමින් ආරම්භ කරන්න) | පදිංචි ලිපිනය | උපන් දිනය දින/මාස/අවු. | ජා.හැ.ප. අංකය | විදේශ ගමන් බලපත්‍ර අංකය | සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කළ දිනය දින/මාස/අවු. | සුදුසුකම් | රැකියාව | සම්බන්ධ කරගත හැකි තොරතුරු |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | | | | | | | | |
| 2. | | | | | | | | |
| 3. | | | | | | | | |
| 4. | | | | | | | | |
| 5. | | | | | | | | |
| 6. | | | | | | | | |
| 7. | | | | | | | | |
| 8. | | | | | | | | |
| 9. | | | | | | | | |

9.4.1. (ආ) ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි

| ප්‍රධාන විධායක නිලධාරියාගේ/ සාමාන්‍යාධිකාරිගේ සම්පූර්ණ නම | පදිංචි ලිපිනය | උපන් දිනය දින/මාස/අවු. | ජා.හැ.ප. අංකය | විදේශ ගමන් බලපත්‍ර අංකය | සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී ලෙස පත්කළ දිනය දින/මාස/අවු. | සුදුසුකම් | රැකියාව | සම්බන්ධ කරගත හැකි තොරතුරු |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | | | | | | | | |
| 2. | | | | | | | | |

මෙම අයදුම්පතේ සඳහන් තොරතුරු පරීක්ෂා කළ බවත්, ඒවා සෑම අතින්ම සම්පූර්ණ බවත් සහ අපගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට එම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, අපි ප්‍රකාශ කර සිටිමු.

.............................................................................................................................................වෙනුවෙන්
(අයදුම්කරන සමාගමේ නම)

| අධ්‍යක්ෂවරුන්ගේ නම් | අත්සන |
|---|---|
| 1 ........................................ | ........................................ |
| 2 ........................................ | ........................................ |
| 3 ........................................ | ........................................ |
| 4 ........................................ | ........................................ |
| 5 ........................................ | ........................................ |
| 6 ........................................ | ........................................ |
| 7 ........................................ | ........................................ |
| 8 ........................................ | ........................................ |
| 9 ........................................ | ........................................ |

දිනය :- ...................................... (සමාගමේ පොදු මුද්‍රාව)

I වන උපලේඛනය

අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන

1. සංස්ථාපිත සහතිකයේ සහතික කරන ලද පිටපතක්.
2. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සහ/හෝ සාංගමික සංස්ථාපත්‍රයෙහි සහතික කරන ලද පිටපතක්.
3. සමාගමේ ලියාපදිංචි ලිපිනය, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නාමාවලිය සහ වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවන ලද එක් එක් වාර්තාවල (13,15,20 ආකෘති පත්‍ර) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරන ලද පිටපත්.
4. 1 වන උපලේඛනය (ඒ) ආකෘතිය ප්‍රකාරව විශේෂිත කොටස් හිමියන්ගේ දිවුරුම් ප්‍රකාශ.
5. 1 වන උපලේඛනය (බී) සහ (සී) ආකෘතීන් ප්‍රකාරව අධ්‍යක්ෂවරුන්ගේ/ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි හෝ එවැනි පත්වීමක් සඳහා තෝරා ගන්නා ලද පුද්ගලයෙකුගේ දිවුරුම් ප්‍රකාශ සහ ප්‍රකාශයන්.
6. අයදුම්පත්‍රය ඉදිරිපත් කරන මාසයට පෙර මාසයේ අවසාන දිනට, අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරා ඇති බවට සුදුසුකම්ලත් විගණකවරයෙකුගෙන් ලබාගත් සහතික කරන ලද ලිපියක්.
7. එක් එක් නිශ්චල දේපළ ප්‍රතිගණනය කළ තක්සේරු වාර්තාවල සහතික කරන ලද පිටපත්.
8. අයදුම්කරන සමාගමේ සහ එහි පාලක සමාගමේ පසුගිය වර්ෂ 3 සඳහා වූ විගණන ගිණුම් වාර්තා.
9. අයදුම්පත්‍රයේ සඳහන් දිනට පෙර මාසය අවසානයට සුදුසුකම්ලත් විගණකවරයෙකු විසින් විගණනය කරන ලද අයදුම්කරන සමාගමේ මූල්‍ය ප්‍රකාශන.
10. අයදුම්කරන සමාගමේ සංවිධාන ව්‍යුහය.
11. අයදුම්කරන සමාගමේ මෙහෙයුම් අත්පොතෙහි පිටපතක්.
12. බලපත්‍රය ලබාගැනීමෙන් පසු එළඹෙන ඉදිරි වර්ෂ තුන තුළ තැන්පතු, ණයදීම් සහ අනෙකුත් මෙහෙයුම් කටයුතුවල සහ ලාභාලාභ පිළිබඳ පුරෝකථනයන් ඇතුළත් ශක්‍යතා වාර්තාවක්.
13. 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ විධිවිධානයන්ට අනුකූලව නිකුත් කර ඇති නියමයන් හා විධානයන්ට අනුකූල වීම සඳහා සමාගමට ඇති හැකියාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශනයක්.
14. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද බදු නිශ්කාෂණ සහතිකය.

*සටහන : උක්ත ඇමුණුම් වලට අමතරව, අයදුම්පත්‍රය ලැබීමෙන් පසු ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හට අවශ්‍ය යැයි හැඟෙන්නේ නම්, අවශ්‍ය ලේඛන, තොරතුරු හෝ වෙනත් විස්තර අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ය.*

1 (ඒ) උපලේඛනය

කොටස් හිමියන් විසින් ඉදිරිපත් කල යුතු දිවුරුම් ප්‍රකාශයේ ආකෘතිය

**දිවුරුම් ප්‍රකාශය**

..........................................................................................................................................(ලිපිනය) හි පදිංචි ..........................
.................................................................... හැඳුනුම්පත් අංක/ගමන් බලපත්‍ර අංක දරන ......................................................................
.................................................................... (සම්පූර්ණ නම) වන මම බෞද්ධ/හින්දු/ක්‍රිස්තියානි/කතෝලික/මුස්ලිම් ආගමිකයකු වශයෙන් ගාම්භීර පූර්වක ව ද, අවංකව ද, සත්‍යවාදීව ද මෙසේ සහතික කරමින් ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි[1] .

1. ඉහත නම සඳහන් ප්‍රතිඥාකරු/දිවුරුම්කරු මම වෙමි.
2. මම.............................................................................................................(සමාගමේ නම) ආයතනයේ කොටස් හිමියෙකු වේ.
3. මම ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පොලිසියක්, යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරයක්, වෘත්තියවේදීන්ගේ සංගමයක්, විමර්ශන කොමිෂන් සභාවක්, විනිෂ්චය සභාවක්, හෝ වෙනත් නීතිමය ආයතනයක් මගින් යම් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව සිදු කරනු ලබන විමර්ශනයකට හෝ විභාග කිරීමකට භාජනය වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
4. මම වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් හෝ ඕනෑම නීතියක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද්දා වූ, රීති, රෙගුලාසි, විධාන හෝ නිර්ණයන්ට අනුකූල නොවීම වැනි ක්‍රියාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීති මගින් පිහිටුවන ලද අධිකරණයකින්, නියාමන හෝ අධීක්ෂණ අධිකාරයකින්, වෘත්තියවේදීන්ගේ සංගමයකින්, විමර්ශන කොමිෂන් සභාවකින්, විනිෂ්චය සභාවකින් හෝ වෙනත් මණ්ඩලයකින් වැරදිකරුවෙකු හෝ එකී ක්‍රියාවට සම්බන්ධ පාර්ශවයක් ලෙස හඳුනාගෙන වැරදිකරුවකු වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
5. මම වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වන වරදකට අධිකරණයකින් වැරදිකරු වී හෝ එවැනි වරදක් සම්බන්ධයෙන් අධිකරණයකින් චෝදනා ලබා නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
6. මම කිසියම් අධිකරණයකින් සදාචාර විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වරදකට වැරදිකරු වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.

මෙම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතිඥාකරුට/දිවුරුම්කරුට කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය එම කරුණු සත්‍ය බවට පිළිගෙන ප්‍රතිඥා දී/දිවුරුම් දී.................. දින ...................................... දී මා ඉදිරිපිටදී අත්සන් තබන ලදී.

අදාළ පරිදි මුද්දර අලවන්න.

මා ඉදිරිපිටදී

සාමදාන විනිශ්චයකාර/
දිවුරුම් කොමසාරිස්

සටහන : 1- අදාළ නොවන වචන කපා හරින්න.
- ක්‍රිස්තියානි සහ කතෝලික පුද්ගලයන් දිවුරා ප්‍රකාශ කර සිටිය යුතු අතර බෞද්ධ, හින්දු, මුස්ලිම් සහ වෙනත් ආගම් අදහන පුද්ගලයන් සහතික කරමින් ප්‍රතිඥා දිය යුතු ය.

**1 (බී) උපලේඛනය**

අධ්‍යක්ෂවරයකු/ප්‍රධාන විධායක නිලධාරිවරයකු/ප්‍රධාන කළමනාකරුවකු/එවැනි පත්වීමක් සඳහා තෝරාගන්නා ලද පුද්ගලයකු විසින් ඉදිරිපත් කළ යුතු දිවුරුම් ප්‍රකාශයේ ආකෘතිය

**දිවුරුම් ප්‍රකාශය**

................................................................................................................................................(ලිපිනය) හි පදිංචි ..............
..................................................................................... හැඳුනුම්පත් අංක/ගමන් බලපත්‍ර අංක දරන .......................................................
................................................................................................(සම්පූර්ණ නම) වන මම බෞද්ධ/හින්දු/ක්‍රිස්තියානි/කතෝලික/මුස්ලිම් ආගමිකයකු වශයෙන් ගාම්භීර පූර්වකව ද, අවංකව ද, සත්‍යවාදීව ද මෙසේ සහතික කරමින් ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි[1].

1. ඉහත නම සඳහන් ප්‍රතිඥාකරු/දිවුරුම්කරු මම වෙමි.
2. ......................................................................................................................................(තනතුර) වන මම ..............................................................................................................(සමාගමේ නම) ආයතනයේ .......................................................................................... (තනතුර) ලෙස පත්කිරීමට තේරීපත්වී ඇත.
3. මා හට අදාළ ක්ෂේත්‍රයන්හි පහත සඳහන් අධ්‍යාපනික සහ/හෝ වෘත්තීමය සුදුසුකම් ඇති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.

   ..............................................................................................................................................................................................

   ..............................................................................................................................................................
4. මා හට පහත සඳහන් පරිදි ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාර, බැංකු කටයුතු, මූල්‍යමය කටයුතු, නීතිමය හෝ පරිපාලනමය හෝ වෙනත් අදාළ විෂයන් පිළිබඳව මනා පළපුරුද්දක් ඇති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.

   ..............................................................................................................................................................................................

   ..............................................................................................................................................................
5. මම ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පොලිසියක්, යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරයක්, වෘත්තියවේදීන්ගේ සංගමයක්, විමර්ශන කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක්, හෝ වෙනත් නීතිමය ආයතනයක් මගින් යම් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව සිදු කරනු ලබන විමර්ශනයකට හෝ විභාග කිරීමකට භාජනය වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
6. මම වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් හෝ ඕනෑම නීතියක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද්දා වූ, රීති, රෙගුලාසි, විධාන හෝ නිර්ණයන්ට අනුකූල නොවීම වැනි ක්‍රියාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීති මගින් පිහිටුවන ලද අධිකරණයකින්, නියාමන හෝ අධීක්ෂණ අධිකාරයකින්, වෘත්තියවේදීන්ගේ සංගමයකින්, විමර්ශන කොමිෂන් සභාවකින්, විනිශ්චය සභාවකින් හෝ වෙනත් මණ්ඩලයකින් වැරදිකරුවෙකු හෝ එකී ක්‍රියාවට සම්බන්ධ පාර්ශවයක් ලෙස හඳුනාගෙන වැරදිකරුවකු වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
7. මම වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වන වරදකට අධිකරණයකින් වැරදිකරු වී හෝ එවැනි වරදක් සම්බන්ධයෙන් අධිකරණයකින් චෝදනා ලබා නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
8. මම කිසියම් අධිකරණයකින් සදාචාර විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වරදකට වැරදිකරුවකු වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
9. මම ශ්‍රී ලංකාවේ හෝ විදේශයක කිසියම් අධිකරණයකින් වස්තු භංගත්වයට හෝ බංකොලොත් භාවයට පත් බවට ප්‍රකාශ කර නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
10. මම ණය ආපසු ගෙවීමට කිසියම් අධිකරණයකින් දෙන ලද නියෝගයක් හෝ ආඥාවක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
11. මම නියාමන හෝ අධීක්ෂණ අධිකාරයක් විසින්, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක කිසියම් ආයතනයක අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරි හෝ වෙනත් නිලධාරියකු ලෙස සේවයෙන් ඉවත් කර හෝ සේවය අත්හිටුවා නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
12. මම අධිකරණයක් මගින් සිහි විකල් වූ පුද්ගලයකු ලෙස ප්‍රකාශයට පත්වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
13. මම

    (අ) නියාමන හේතූන් මත බලපත්‍රය හෝ ව්‍යාපාරය අවලංගු කරනු ලැබූ හෝ අත්හිටුවනු ලැබූ හෝ

    (ආ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක දී ඈවර වූ හෝ ඈවර වෙමින් පවතින හෝ අනිවාර්යය ඈවර කිරීමකට යටත්ව සිටින්නා වූ ඕනෑම බලපත්‍රලාභී බැංකුවක, බැංකු නොවන මූල්‍ය ආයතනයක, අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධාරියකු හෝ වෙනත් බලතල සහිත තනතුරක් දරා නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.

14. මම වෙනත් බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක අධ්‍යක්ෂවරයෙක් හෝ සේවානියුක්තිකයකු නොවන බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.

මෙම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතිඥාකරුට/දිවුරුම්කරුට කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය එම කරුණු සත්‍ය බවට පිළිගෙන සහතික කර දිවුරා.................... දින ........................................ දී මා ඉදිරිපිටදී අත්සන් තබන ලදී.

අදාළ පරිදි මුද්දර අලවන්න.

මා ඉදිරිපිටදී

සමාදාන විනිශ්චයකාර/
දිවුරුම් කොමසාරිස්

සටහන : 1- අදාළ නොවන වචන කපා හරින්න.
- ක්‍රිස්තියානි සහ කතෝලික පුද්ගලයන් දිවුරා ප්‍රකාශ කර සිටිය යුතු අතර බෞද්ධ, හින්දු, මුස්ලිම් සහ වෙනත් ආගම් අදහන පුද්ගලයන් සහතික කරමින් ප්‍රතිඥා දිය යුතු ය.

1 (සී) උපලේඛනය

**සමාගමේ නම :** ........................................................................................................................

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි/එවැනි පත්වීමක් සඳහා තෝරා ගන්නා ලද පුද්ගලයෙක් විසින් ඉදිරිපත් කල යුතු ප්‍රකාශය**
**(............... දිනට අදාළ ඇමුණුම් සහිතව)**

1. පුද්ගලික තොරතුරු

 1.1. සම්පූර්ණ නම:........................................................................................................................
 1.2. ජාතික හැඳුනුම්පත් අංකය:..............................................................................................
 1.3. විදේශ ගමන් බලපත්‍ර අංකය:..........................................................................................
 1.4. උපන් දිනය: ..........................................................................................................................
 1.5. ස්ථිර ලිපිනය: ........................................................................................................................
 1.6. වර්තමාන ලිපිනය: .............................................................................................................

2. අයදුම් කරන සමාගමෙහි පත්වීම

 2.1. මණ්ඩලයට/වර්තමාන තනතුරට පත්වූ දිනය: ..............................................................................
 2.2. තනතුර: ......................................................................................................................................
 2.3. දේශීය හෝ විදේශික බව: .......................................................................................................
 2.4. වාර්ෂික වේතනය ( විස්තර සහිතව):
 2.5. අධ්‍යක්ෂවරයා හෝ ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි සහ/හෝ ඔහුගේ/ඇයගේ පවුලේ සාමාජිකයින් සමාගමේ වත්කම් භාවිතයෙන් උපයාගත් ප්‍රතිලාභවල වාර්ෂික වටිනාකම:
 (උදා: සමාගමේ භූමිය, ගොඩනැගිලි, වාහන ආදිය)
 2.6. ඉහත 2.5 සඳහන් වත්කම් නඩත්තුව සඳහා හෝ වියදම් ප්‍රතිපූරණය (ණය කාඩ් බිල්පත්, උපයෝගිතා බිල්පත් යනාදිය) සඳහා සමාගම විසින් දැරූ වියදම්.
 2.7. එම වත්කම් මිලදී ගත් අගය සහ පොත් අගය හා නිශ්චල වත්කම් පිහිටා ඇති ස්ථානය.

3. ඥාතීන්ගේ පුද්ගලික තොරතුරු

 3.1. කලත්‍රයාගේ සම්පූර්ණ නම: ...........................................................................................
 3.2. ජාතික හැඳුනුම් පත් අංකය: ............................................................................................................
 3.3. විදේශ ගමන් බලපත්‍ර අංකය: ...........................................................................................................
 3.4. යැපෙන දරුවන්ගේ විස්තර:

| | සම්පූර්ණ නම | ජා.හැ. අංකය | විදේශ ගමන් බලපත්‍ර අංකය |
|---|---|---|---|
| 3.4.1 | | | |
| 3.4.2 | | | |
| 3.4.3 | | | |

4. **පසුබිම සහ අත්දැකීම්**

 ඔහු/ඇය අධ්‍යක්ෂ වශයෙන් හෝ ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි වශයෙන් සේවය කළ ආයතනවල නම්:

| ආයතනයේ නම | සේවා කාලය | තනතුර |
|---|---|---|
| | | |
| | | |
| | | |

5. **බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් වල සහ ඒ ආශ්‍රිත සමාගම්වල කොටස් හිමිකම**

බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්, ඒවායේ පාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් වල දැනට දරන කොටස් හිමිකාරිත්වයක් ඇත්නම් ඒ පිළිබඳ විස්තරඃ

| ආයතනයේ නම | කොටස් ගණන | හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

6. **ව්‍යාපාරික ගනුදෙනු**

අයදුම්කරන සමාගම, එහි පාලිත සමාගම් හෝ ආශ්‍රිත සමාගම් (ඇත්නම්) සහ අනෙකුත් මූල්‍ය සමාගම් සමග අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරි හෝ එවැනි පත්වීමක් සඳහා තෝරා ගනු ලැබූ පුද්ගලයෙකු විසින් දැනට පවත්වාගෙන යන කුමන ආකාරයේ හෝ ව්‍යාපාරික ගනුදෙනු වේ නම් ඒ පිළිබඳ විස්තර.

| ආයතනයේ නම | ගනුදෙනුවේ ස්වභාවය | දිනට වටිනාකම දින/මාස/අවු. (රුපියල් මිලියන) | | ණය වර්ගීකරණය | සුරැකුම් | |
|---|---|---|---|---|---|---|
| | | සීමාව | පිටහිටි ශේෂය | (ක්‍රමික/අක්‍රමික) | වර්ගය | වටිනාකම (රු. මිලියන) |
| | | | | | | |
| | | | | | | |

7. ඉහත දැක්වූ තොරතුරු වඩාත් පැහැදිලි වීමට අදාළ වෙනත් විස්තර/තොරතුරු සහ අයදුම්කරන සමාගමක අධ්‍යක්ෂවරයාගේ හෝ ප්‍රධාන විධායක නිලධාරියාගේ හෝ සාමාන්‍යාධිකාරිගේ හෝ එවැනි තනතුරක් සඳහා තේරීපත්වන පුද්ගලයෙකුගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා අදාළ වේ යැයි හැඟෙන වෙනත් තොරතුරු .

**ප්‍රකාශය**

ඉහත මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනුමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවටත් සම්පූර්ණ බවටත් තහවුරු කරමි. ඉහත සපයන ලද තොරතුරු වලට අදාළව, කිසියම් වෙනසක් වූ වහාම, සියලු තොරතුරු බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ නිසි පරිදි දැනුවත් කරන බවට මම පෙරොන්දු වෙමි.

ඉහත තනතුර දැරීම සඳහා කිසියම් නීතියකින් මා හට සීමාවන් පනවා නොමැති බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

**දිනය :.............................** ..........................................................................................................

**අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි හෝ එවැනි පත්වීමක් සඳහා තෝරා ගන්නා ලද පුද්ගලයෙකුගේ අත්සන.**

**අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින් සම්පූර්ණ කිරීම සඳහා**

ඉහත සපයන ලද තොරතුරු හා බැඳෙන වෙනත් පැහැදිලි කිරීම්/ තොරතුරු සහ අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරි හෝ සාමාන්‍යාධිකාරි හෝ එවැනි තනතුරක් සඳහා තෝරා ගන්නා ලද පුද්ගලයෙකුගේ හෝ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා අදාළ වේ යැයි හැඟෙන වෙනත් තොරතුරු.

**දිනය : ............................................** ...............................................................................

**අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිගේ අත්සන.**

11 - 611/1

**මුදල් මණ්ඩලය**

**ශ්‍රී ලංකා මහ බැංකුව**

2016 ඔක්තෝබර් 27 **ක්ෂුද්‍රමූල්‍ය පනතේ රීති** 2016 අංක 02

**බලපත්‍ර ගාස්තුව**

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 13(2) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1.ආරම්භක බලපත්‍ර ගාස්තුව

1.1. බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් බලපත්‍රය ලබා ගනු ලබන වර්ෂය සඳහා රුපියල් පනස්දහසක (රු. 50,000) මූලික බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු අතර එය බලපත්‍රය ලබා ගන්නා දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවිය යුතු ය.

2.වාර්ෂික බලපත්‍ර ගාස්තුව

2.1. සෑම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්ම බලපත්‍රය ලබාගත් පසුව එළඹෙන සෑම වර්ෂයක් සඳහාම පහත පරිදි සමාගමේ මුළු වත්කම් මත පාදක වූ බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු අතර එය අදාළ වර්ෂයේ ජනවාරි 31 හෝ ඊට පෙර ගෙවිය යුතු ය.

| *පසුගිය වසර අවසාන දිනට මුළු වත්කම් එකතුව* | *වාර්ෂික බලපත්‍ර ගාස්තුව (රු.)* |
|---|---|
| රු. මිලියන 250 හෝ ඊට පහල | 50,000 |
| රු. මිලියන 250 සිට රු. මිලියන 500 දක්වා | 100,000 |
| රු. මිලියන 500 සිට රු. මිලියන 750 දක්වා | 150,000 |
| රු. මිලියන 750 සිට රු. බිලියන 01 දක්වා | 200,000 |
| රු. බිලියන 01 ට ඉහල | 250,000 |

ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
මුදල් මණ්ඩලයේ සභාපති
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

11 - 611/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.